" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 0112 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 0112 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 0112 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2022

ඔබේ අංකය / உமது இலக்கம் / Your No.

දිනය / திகதி / Date 2023.01. 11

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන,සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්ටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.01.10 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2022.12.02<br>රා.ප.චක්‍රලේඛ 03/2019(IV) | ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය |
| 02 | 2022.12.02<br>රා.ප.චක්‍රලේඛ 35/92(VI) | රජයේ නිලධරයන් පිළිබඳව විනය පරීක්ෂණ ඉක්මන් කරවීම: ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම XLVIII පරිච්ඡේදය |
| 03 | 2022.12.16<br>රා.ප.චක්‍රලේඛ 30/2022 | 2023 වසර- රාජකාරි කටයුතු ඇරඹීම |
| 04 | 2022.12.17<br>රා.ප.චක්‍රලේඛ 29/2022 | ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වැනි වගන්තිය සංශෝධනය කිරීම |
| 05 | 2022.12.17<br>රා.ප.චක්‍රලේඛ 28/2022 | ජ්‍යේෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම |
| 06 | 2022.12.30<br>රා.ප.චක්‍රලේඛ 31/2022 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2023 |

කේ.එන්.සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 28/2022

මගේ අංකය : EST-6/03/LEA/3162(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.12. 17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම**

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 15:1:1 උප වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමටත්, 16:16 ලෙස නව උප වගන්තියක් පහත පරිදි ඇතුළත් කිරීමටත්, 2022.09.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

15:1:1 කෙසේ වුව ද, ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට සමාන උපාධියක් හැදෑරීමෙන් පසු ආචාර්ය උපාධියක් හැදෑරීම සඳහා රාජ්‍ය නිලධරයන්ට මෙරට තුළ අවුරුදු 3ක් දක්වා ජ්‍යෙෂ්ඨතාවට සහ විශ්‍රාම වැටුපට ගණන් ගන්නා පරිදි වැටුප් රහිත අධ්‍යයන නිවාඩු දිය හැකි ය.

නිර්බාධක උසස් කිරීමක් නොවන උසස් කිරීමකට අදාළ පූරප්පාඩුව නිලධරයා විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු කාලය තුළ ඇති වුව ද, නිලධරයා වැටුප් රහිත නිවාඩු කාලය අවසන් කර නැවත සේවයට වාර්තා කිරීමෙන් පසුව ඇති වුව ද, නියමිත කාර්යය පටිපාටිය අනුගමනය කර නිලධරයා වැටුප් රහිත නිවාඩුව අවසන් කර සේවයට වාර්තා කිරීමෙන් පසුව එළඹෙන දිනක සිට ක්‍රියාත්මක වනසේ එම උසස් වීම ලබා දිය යුතු ය.

16:16 ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16:1:2 සහ 16:1:3 උප වගන්ති යටතේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගන්නා නිලධරයන් සඳහා එසේ ලබා ගන්නා වැටුප් රහිත විදේශ නිවාඩු කාලසීමාව වෙනුවෙන් ඉහත 16:8, 16:9, 16:10 සහ 16:11 උප වගන්තීන්හි සඳහන් විධිවිධාන අදාළ නොවන අතර, එම වැටුප් රහිත විදේශ නිවාඩු කාලසීමාව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාව හා විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා සේවා කාලයක් ලෙස ගණන් ගත යුතු ය.

නිර්බාධක උසස් කිරීමක් නොවන උසස් කිරීමකට අදාළ පූරප්පාඩුව නිලධරයා විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු කාලය තුළ ඇති වුව ද, නිලධරයා වැටුප් රහිත නිවාඩු කාලය අවසන් කර නැවත සේවයට වාර්තා කිරීමෙන් පසුව ඇති වුව ද, නියමිත කාර්යය පටිපාටිය අනුගමනය කර නිලධරයා වැටුප් රහිත නිවාඩුව අවසන් කර සේවයට වාර්තා කිරීමෙන් පසුව එළඹෙන දිනක සිට ක්‍රියාත්මක වනසේ එම උසස් වීම ලබා දිය යුතු ය.

02. ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 15 හෝ 16 හෝ වගන්තිවල විධිවිධාන අනුව දැනටමත් දේශීය හෝ විදේශීය හෝ වැටුප් රහිත නිවාඩු ලබා ආචාර්ය උපාධියක් හදාරමින් සිටින අනුමත වැටුප් රහිත නිවාඩු කාලය ඉක්මවා නොමැති නිලධරයන් සඳහා ද මෙම චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක වන දිනෙන් පසුව වන එම වැටුප් රහිත නිවාඩු කාලසීමාව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාව හා විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා සේවා කාලයක් ලෙස ගණන් ගත යුතු ය.

03. තනතුර හෝ සේවය සඳහා අනුමත බඳවාගැනීම් පරිපාටියෙහි හෝ සේවා ව්‍යවස්ථාවෙහි ආචාර්ය උපාධියක් හැදෑරිය යුතු බවට විධිවිධාන ඇතුළත්ව නොමැති තනතුරක් දරන හෝ සේවයකට අයත් රජයේ නිලධරයෙකු සඳහා මින් ඉදිරියට ආචාර්ය උපාධියක් සඳහා නිවාඩු අනුමත කළ යුත්තේ ඉහත විධිවිධාන අනුව පමණක් බව ද මෙයින් අවධාරණය කරමි.

04. මෙම චක්‍රලේඛ විධිවිධාන 2022.09.12 දින සිට ක්‍රියාත්මක වේ.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk